I. ආශා හා නීෂා 3 : 2 අනුපාතයට ලාභ අලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක නිරත වූහ. 2019. 03. 31 දිනට ව්‍යාපාරයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත දැක්වේ.

ආශා හා නීෂා හවුල් ව්‍යාපාරය
2019. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | |
|---|---|---|
| | | රු. 000 |
| දේපළ පිරියත හා උපකරණ | | 250 |
| ජංගම වත්කම් | | 130 |
| | | 380 |
| ප්‍රාග්ධන ගිනුම් | | |
| ආශා | 180 | |
| නීෂා | 90 | 270 |
| ජංගම ගිනුම් | | |
| ආශා | 18 | |
| නීෂා | 12 | 30 |
| ජංගම නොවන වගකීම් | | 50 |
| ජංගම වගකීම් | | 30 |
| | | 380 |

ii. 2019. 04. 01 දින ලාභයෙන් 1/6 ක් සඳහා ඊෂා ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී.
ඊෂා ප්‍රාග්ධනය ලෙස රු. 100 000/= ක් ව්‍යාපාරයට රැගෙන ආවේය. 2020. 03. 31 න් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයෙහි ශුද්ධ ලාභය 154 500/= ක් වූ අතර පහත ගැලපීම් කිරීමට පෙර මෙම ලාභය ගණනය කොට තිබුණි.

1. ආශාගේ රු. 3 000/= ක පුද්ගලික රක්ෂණ වාරිකය ව්‍යාපාරය විසින් දරා ඇත.
2. නීෂා සිය පුද්ගලික මුදලින් රු. 5 000/= ක ව්‍යාපාරික රක්ෂණ ගාස්තු ගෙවා තිබුණි.
3. 2020. 09. 30 න් අවසන් අර්ධ වර්ෂය සඳහා වූ රු. 12 000 ක ප්‍රචාරණ ගාස්තු කාලච්ඡේදයේ වියදමක් ලෙෂ සලකා ඇත.
4. නීෂා ගෙවූ විදුලි ගාස්තු 4 000/= ක් ව්‍යාපාරයෙහි වියදමක් ලෙස සලකා නොමැත.
5. මසකට රු. 3 000/= ක් ලබා දී මේ පොරොන්දුව මත ව්‍යාපාරයට යොදවා ඇති ආශාගේ ගොඩනැගිල්ල සඳහා වූ කුලිය 2020 වර්ෂයෙහි සිට 4 000/= දක්වා වැඩිකර ඇතත් ගාස්තු වැඩි වීම පිළිබඳ ගැලපීම් සිදු කොට නොමැත.
6. ජංගම නොවන වගකීම් 2019. 09. 30 දින ලබාගත් 10% බැංකු ණය වන අතර ඒ සඳහා අදාල පොලිය

කාලච්ඡේදයෙහි අවසන් දින වන විටත් ගෙවා නොමැත.

නව හවුල් ගිවිසුමේ පහත කරුණු ඇතුලත්ය :-

අ. ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත හවුල් කරුවන්ට 10% වාර්ෂික පොලියක් හිමි වේ.

ආ. ආශා, නීෂා, ඊෂා පිළිවෙලින් රු. 2 000/= රු. 1 500/= හා රු. 1000/= බැගින් වූ මාසික වේතන සඳහා හිමිකම් කියති.

ආශා, නීශා, ඊසා ගිණුම් කාලච්ඡේදය තුළ දී පිළිවෙලින් රු. 5000/= රු. 3 000/= හා රු. 2 000/= ක් බැගින්
ගැනිලි සිදු කර ඇත.

අවශ්‍ය වන්නේ,

1. විසර්ජනය කල හැකි නිවැරදි ලාභය
2. හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්
3. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු ජංගම වත්කම් හා ජංගම වගකීම්.